**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයාගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදුවූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.මිලියන 10.26 ක් 2020 ජනවාරි 01 දින ඉදිරියට ගෙන ආ සමුච්චිත ඌනතාවයට හා රු.මිලියන 2.8 ක් අනෙකුත් සංචිත ශේෂයට ගලපා තිබුණි. මේ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමක්ද සිදුකර නොතිබුණි. | මෙම කරුණ සමග එකඟ වන බව හා මෙවැනි තත්ත්වයන් 2021 වර්ෂයේදී සිදුනොවීමට උපදෙස් ලබා දී ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.මිලියන 2,901.52 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එසේ වුවත් මෙකී වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර එම වත්කම්වල ඵලදායී ජීව කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණ ක්ෂයවීම් අවසන් කර ඇති ස්ථාවර වත්කම් තවමත් භාවිතයේ පවතින බැවින් මෙම සියලුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බව හා එය මෙම වර්ෂයේදී අවසන් කිරීමට කටයුතු කරනු ඇති බව. | සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනටමත් භාවිතා කරනු ලබන වත්කම් සම්බන්ධව ප්‍රමිතිවල සඳහන් නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 39 (අ) ඡේදය ප්‍රකාරව, සේවා සැපයීමට අදාළ ගනුදෙනුවල අයභාර හඳුනාගැනීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 2,353.15 ක්වූ රෝහල් ගාස්තු (Hospital Charges) ගණනය කිරීම සඳහා අනුගමනය කරන ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | | රෝහල් ගාස්තු ගණනය කිරීම සඳහා නිශ්චිත ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු අතර එම ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී ඇඳඉහපත් 15කට අදාළ ණයගැති හා නිදහස් රෝහල් වියදම් වටිනාකම නැවත නැවත රෝහල් පාලන ගිණුමට බැරකර තිබීම හේතුවෙන් රෝහල් ගාස්තු ආදායම රු. මිලියන 13.81 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු බව නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. | පරිගණක පද්ධතිය පරීක්ෂා කර බලා මෙහි සඳහන්ව ඇති වටිනාකම හා ඊට අමතරව විගණන විමසුමේ පෙන්වා දී ඇති ගිණුම්කරණ දෝෂය 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු පාලන ගිණුමේ පැවති රු.මිලියන 4.23 ක හර ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු නොකර ඒ වෙනුවට එම ශේෂය රෝහල් නේවාසික ගාස්තු ආදායම් ගිණුමට මාරුකර තිබුණි. ඒ හේතුවෙන් රෝහල් නේවාසික ගාස්තු ආදායම ඊට සමාන අගයකින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | රෝහල් ගාස්තු පාලන ගිණුම, 2021 දෙසැම්බර් 31 දිනට විශ්ලේෂණය කර වෙනසක් තිබේනම් අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කරනු ඇති බව හා විගණන විමසුමෙන් පෙන්වා දී ඇති කරුණු ඉදිරියේදී සිදුනොවීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | වෘත්තිය ගාස්තු වෘත්තිය අයකිරීම් හා ආපසු ගෙවීම් නිසි පරිදි ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට වෘත්තිය ගාස්තු ගිණුමේ පැවති රු.මිලියන 62.64 ක හර ශේෂයට හේතු | විගණන විමසුමේ සඳහන් කරුණු සමග එකඟ වන බව හා වෘත්තිය ගාස්තු නිවැරදිව ගිණුම් තුල ගිණුම්ගත වීමට අදාල කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතින බව. | වෘත්තිය ගාස්තු වෘත්තිය අයකිරීම් හා ආපසු ගෙවීම් සම්බන්ධව ප්‍රතිපත්තියක් |

| | | | |
|---|---|---|---|
| | හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කරනු වෙනුවට එම ශේෂය රෝහල් ගාස්තු පාලන ගිණුමට මාරුකර තිබුණි . ඒ හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම 1998 වර්ෂයේ සිට පැවතෙන රු.මිලියන 3.62 ක්වූ ගෙවිය යුතු වෘත්තීය ගාස්තු ගිණුමේ දැක්වෙන ශේෂය නිරවුල් කිරීමට හෝ ආදායමක් ලෙස හඳුනාගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | | පිළියෙල කර ඒ් අනුව අයකිරීම් හා ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 20.45 ක්වූ ණයගැතියන්ගෙන් අයකර ගත යුතු මුදල් අයකර ගැනීමට නොහැකි බව හඳුනාගෙන තිබුණු නමුත් ඒ වෙනුවෙන් වන හානිකරණ අගය සඳහා ප්‍රතිපාදනයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිකර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට ණයගැතියන්ගෙන් අඩමාන ණය වෙන්කිරීමක් සිදුකිරීමට කටයුතු කරන අතර එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වත්කම්වල වටිනාකම රු.මිලියන 1.33 ක් ස්ථාවර වත්කම් ගිණුම්වලට නිවැරදිව හර කර තිබුණු නමුත් පරිත්‍යාග හා ප්‍රදාන ගිණුමට බැර කරනු වෙනුවට ණයහිමි ගිණුමට බැර කර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වත්කම් ණයහිමි ගිණුමට බැරකර තිබීම 2021 වර්ෂයේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු ණයගැති ගිණුමේ පැවති රු.මිලියන 22.88 ක් වූ බැර ශේෂවලට හා වෙළඳ ණයහිමි ගිණුමේ පැවති රු.මිලියන 22.26 ක්වූ හර ශේෂවලට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කරනු වෙනුවට එම ගිණුම්වල ප්‍රතිවිරුද්ධ ශේෂවලට එරෙහිව හිළව්කර දක්වා තිබුණි. එසේම පෞද්ගලික අංශයේ බැංකුවක මහාරෝග්‍යශාලා මණ්ඩලය නමින් වූ ජංගම ගිණුමක 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 5.13 ක්වූ අයිරා ශේෂය, ජංගම වගකීමක් ලෙස හෙළිදරව් කරනු වෙනුවට ජංගම වත්කම්වලින් අඩුකර දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී ණයගැති සහ ණයහිමි ගිණුම්වල සැසඳුම් කටයුතු සිදුකරමින් පවතින අතර 2021 වර්ෂය සඳහා ගිණුම් ඉදිරිපත් කිරීමේදී එම තත්ත්වය නිවැරදි කරන බව. | ගිණුම්වල දැක්වෙන වෙනස්කම්වලට හේතු හඳුනාගෙන ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන රු.මිලියන 12.50 ක්වූ Dialysis Assistant අරමුදලට අදාළ ස්ථාවර තැන්පතුව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | Dialysis Assistant අරමුදලට අදාල ස්ථාවර තැන්පතුව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව පෙන්වා ඇති බව. | අරමුදල්වලට අදාළ ආයෝජන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2018 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයෙන් මහාරෝග්‍යශාලා මණ්ඩලය වෙත ලැබී තිබුණු BMW වර්ගයේ මෝටර් රථය මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සභාපති නමින් ලියාපදිංචි කර තිබුණු නමුත් එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ එම මෝටර් රථයේ ප්‍රත්‍යාගණන වටිනාකම ගිණුම්වල සටහන් කර ඇති බව. | මණ්ඩලයට අයත් වත්කම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2016/2017 වර්ෂවලදී කඩා ඉවත්කර තිබුණු ගොඩනැගිලි 02ක පිරිවැය රු.මිලියන 3.63 ක් හා අදාල සමුච්චිත ක්ෂය පොත්වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. මෙම නිසා ගොඩනැගිලි පිරිවැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම 2016 වර්ෂයේදී විකුණා තිබුණු නමුත් විකුණුම් වටිනාකම හඳුනාගත නොහැකි වූ හා 2017 හා 2018 වර්ෂවලදී අපහරණය කර රු.මිලියන 5.03 කට විකුණා තිබුණු උපකරණවල පිරිවැය හා සමුච්චිත ක්ෂයද හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | මෙම වරද 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදිකර ඇති බව. | මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ඍ) | ගිණුම්තැබීමේ දෝෂ හේතුවෙන් කෙරීගෙන යන වැඩ ගිණුමෙහි රු.මිලියන 38.55 ක් හා රු.මිලියන 8.29 ක් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.මිලියන 30.26 ක ශුද්ධ අගයක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | -එම- | -එම- |
| (ඎ) | සේවයෙන් ඉවත්කර තිබුණු සේවකයෙකු විසින් රෝහලට එරෙහිව කම්කරු විනිශ්චය සභාවේ පැවරූ නඩුවකට අදාළව මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් එම විනිශ්චය සභාවේ තැන්පත් කර තිබුණු මුදල රු.මිලියන 1.62 ක් විය. කම්කරු විනිශ්චය සභාව විසින් එම මුදල සමාලෝචිත වර්ෂය තුළදී අදාළ සේවකයා වෙත ගෙවා තිබුණු නමුත් එම ගෙවීම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා ජංගම වත්කම් ඊට සමාන අගයකින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | -එම- | මෙම වරද නිවැරදි කළ යුතුය. |
| (ඏ) | මහාරෝග්‍යශාලා මණ්ඩලයේ ගිණුම්වලට අනුව, මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් වෛද්‍ය සැපයුම් අංශය වෙතින් මිලදී ගෙන තිබුණු ඖෂධ හා වෙනත් ශල්‍ය ද්‍රව්‍ය වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු.මිලියන 472.52 ක් වුවද, වෛද්‍ය සැපයුම් අංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එදිනට එම ශේෂය රු.මිලියන 631.89 ක් විය. ඒ අනුව වූ රු.මිලියන 159.37ක වෙනසට හේතු හඳුනාගෙන අදාල | වෛද්‍ය සැපයුම් අංශයෙන් ලබාගන්නා වකුගඩු රෝගීන් සඳහා පමණක් නිකුත් කරන ඖෂධ මුදල් අයකිරීමකින් තොරව රෝහල වෙත ලබාදීමට අනුමැතිය හිමිවී ඇති බැවින් එම ඖෂධවල වටිනාකම සඳහන් නොකර පරිගණක පද්ධතියට ඇතුළත් කරන බව, ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල | වෛද්‍ය සැපයීම් අංශය වෙතින් මිලදී ගනු ලබන ඖෂධ හා අනෙකුත් ශල්‍ය ද්‍රව්‍ය සඳහා ගෙවිය යුතු මුදල මහාරෝග්‍යශාලා මණ්ඩලයේ ගිණුම් |

| | | |
|---|---|---|
| ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | සඳහන් අගය නිවැරදි බව, වෛද්‍ය සැපයුම් අංශයෙන් අන්තරායකර ඖෂධ මිලදී ගැනීමේදී ඒ සඳහා අදාළ ගෙවීම් සිදුකිරීමෙන් පසුව පමණක් එම ඖෂධ ලබාදීම සිදුකරනු ලබන බව හා වෛද්‍ය සැපයීම් අංශයේ ඇති වටිනාකම අපගේ මූල්‍ය ප්‍රකාශනවල ඇති වටිනාකම සමඟ ගැලපීම උචිත නොවන බව. | සමඟ සැසඳීමේ ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

**1.5.3 නොසැසඳු ගිණුම් හෝ වාර්තා**

| විෂයය | | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | ලැයිස්තු, ලේඛන, පරිගණක වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | | |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමියෝ | 581.93<br>581.93 | 589.81<br>578.49 | 7.88<br>3.44 | ලිපිගොනු, ලේඛන හා ලෙජරයේ ශේෂයන් අතර වෙනසට අදාළ ගිණුම් සැසඳීම 2021 වර්ෂයේදී අවසන් කිරීමට සැලසුම්කර ඇති බව, ඒ අනුව මෙම ගිණුම්වල කේවල ශේෂ හා ප්‍රධාන ලෙජර අතර වෙනස නිවැරදිවනු ඇති බව. | Accpac ගිණුම්කරණ පද්ධතියේ පවතින දෝෂ හඳුනාගෙන නිවැරදි කිරීමටත්, කේවල ණයහිමි ශේෂ ලැයිස්තුව හා ණයහිමි ගණුදෙනු වාර්තාවට අනුව ශේෂයන් එකිනෙකට ගැලපෙන ලෙසටත් සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයහිමි ශේෂය හා සැසඳෙන ලෙසටත් පවත්වා ගත යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු ණයගැතියෝ | 303.67<br>303.67 | 357.24<br>356.68 | 53.57<br>53.01 | -එම- | Accpac ගිණුම්කරණ පද්ධතියේ පවතින දෝෂ හඳුනාගෙන නිවැරදි කිරීමටත්, කේවල ණයගැති ශේෂ ලැයිස්තුව හා පාරිභෝගික ගණුදෙනු වාර්තාව එකිනෙකට ගැලපෙන ලෙසටත් සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ශේෂය හා සැසඳෙන ලෙසටත් පවත්වා ගත යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු තැන්පතු | 10.60 | 8.66 | 1.95 | -එම- | වෙනසට හේතු හඳුනාගෙන අදාළ පරිදි ගැලපීම් සිදුකළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. මිලියන | | | |
| (අ) විවිධ තැන්පතු | 6.16 | වර්ෂ 36 කට වඩා පැරණි විවිධ තැන්පතු ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කරගත හැකි ලේඛන. | මෙම බොහෝ තැන්පතු 1984-1985 කාලවකවානුවට අදාළ වන බැවින් හා එම අවධියේදී එම තැන්පතු සඳහා නිකුත් කර ඇති රිසිට්පත් අදාළ වවුචරය සමඟ අමුණා ඇති බැවින් මෙම පැරණි වවුචරපත් දැනට විනාශකර ඇති බව. | මුදල් තැන්පත් කර ඇති ආයතනවලින් විමසා තැන්පතු ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කරගත යුතුය. |
| (ආ) සේවා ගාස්තු | 0.55 | වෘත්තීය ගාස්තුවලින් සියයට 0.15 ක් පමණක් රෝහල් සේවා ගාස්තු ලෙස අයකර ගැනීමට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය. | 2021 වර්ෂයෙදී විගණනයට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) 2020 දෙසැම්බර් 31 දිනට රෝහල් ගාස්තු ණයගැතියෝ හා වෙළඳ ණයහිමියෝ | 303.67<br>581.93 | හිඟ කාලසීමාව නිසි ලෙස අනාවරණය වන පරිදි පිළියෙල කරන ලද ණයගැති හා ණයහිමි කාල විශ්ලේෂණ | -එම- | ණයගැති හා ණයහිමි කාල විශ්ලේෂණ මූලා‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 0.80 | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු පිළිබඳ උපලේඛන හා කාලවිශ්ලේෂණය | -එම- | උපලේඛන හා කාලවිශ්ලේෂණය විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 4 සිට වර්ෂ 23 ක කාලයක සිට පැවත එන එකතුව රු.මිලියන 5.73 ක්වූ ගෙවිය යුතු ශේෂ 16 ක් නිරවුල් කිරීමට හෝ වගකීමක් නොමැති ශේෂ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | ජල ප්‍රවාහන මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල වර්ෂ 10 කට වඩා පැරණි වන බැවින් හා එම මුදල ඉල්ලා සිටින්නේ නැති බැවින් ගිණුම්වලින් ඉවත්කිරීමට කටයුතු කරන බව, ගෙවිය යුතු වෘත්තීය ගාස්තු වර්ෂ 20 කට වඩා පැරණි වන නමුත් වෘත්තීය ගාස්තු ගෙවීමේදී සිදු වූ අක්‍රමිකතාවයක් පිළිබඳ විමර්ෂණ කිරීමට මෙම ලිපි ලේඛණ පරීක්ෂණ කණ්ඩායම විසින් රැගෙන ගොස් ඇති බව, අනිකුත් විවිධ ණයහිමි ශේෂ හා කාර්ය සාධන ඇප බැඳුම්කර තැන්පතු පිළිබඳ සොයා බලා ගිණුම් වලින් ඉවත් කිරීමට හා ගැලපීම් කිරීමට කටයුතු කරන බව හා ඉතිරි මුදල වර්ෂ 25 කටත් වඩා පැරණි ශේෂයන් වන බැවින් ගිණුම්වලින් ඉවත් කරන බව. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට හෝ ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හෝ කටයුතු කළ යුතුය. |

### 1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ඡේදය | | | |
| (i) 2.1 හා 2.2 සිට 2.6 දක්වා වූ ඡේද | කාර්ය මණ්ඩලයේ සෑම සේවයකම හා සෑම ශ්‍රේණියකම තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්, තනතුරෙහි වැටුප් පරිමාණය, වයස් සීමාව සහ අදාළ අනෙකුත් විස්තර ඇතුළත්කර බඳවා ගැනීමේ පටිපාටි පිළියෙල කර ආයතන සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් එකී පටිපාටි සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීම් පටිපාටි පිළියෙල කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ වන විට පිළියෙල කර අවසන් බඳවා ගැනීමේ පටිපාටිය රේඛීය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට නියමිත බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (i) 5.2.6 උප ඡේදය | බඳවා ගැනීමේ තේරීම් මණ්ඩලය එහි සභාපතිද ඇතුළුව නිලධාරීන් 5 දෙනෙකුගෙන් සමන්විතව, එම | නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා | ආයතන සංග්‍රහයේ දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| | | මණ්ඩලයේ යටත් පිරිසෙන් එක් සාමාජිකයකු පුරප්පාඩු පවත්නා අමාත්‍යාංශය හෝ ආයතනයෙන් පරිබාහිර වූ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක නිලධාරියෙකුගෙන් සමන්විත විය යුතු වුවද, මහාරෝග්‍යශාලා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමේදී එම අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නොතිබුණි. | ගැනීම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව සිදු වී ඇති බව. | ඇති විධිවිධානවලට පටහැනිව කටයුතු කළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2014 ඔක්තෝබර් 11 දින රජයේ ගැසට් පත්‍රයේ සඳහන් ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය | වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කරමින් සිටි නිලධාරිනියක වෛද්‍ය නිලධාරී II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් වීමේදී වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව සපුරා තිබිය යුතු සුදුසුකම් සම්පූර්ණකර නොතිබියදී නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා 2017 පෙබරවාරි 01 දින සිට පත්කර තිබුණි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව සිදු වී ඇති බව. | ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව කටයුතු කළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම ආරම්භකර ඇති බව හා මෙම ලේඛනය 2021 වර්ෂයේ ගිණුම් සමඟ විගණනය සඳහා ඉදිරිපත් කිරීමට උත්සාහ කරන බව. | භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය. | මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත අනුමත මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතු වුවද, 2020 මූල්‍ය වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ගිණුම් මාස 08 කට වඩා වැඩි කාල ප්‍රමාදයක් සහිතව 2021 නොවැම්බර් 11 දින ඉදිරිපත් කර තිබුණි. | 2021 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කරන බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | (i) 6.3.6 මාර්ගෝපදේශය | ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා ගත කළ යුතු අතර, එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලුම සාමාජිකයන් විසින් අත්සන් කළ යුතු වුවද ඖෂධ මිලදී ගැනීමේදී එසේ කර නොතිබුණි. | ලංසු විවෘත කිරීමේදී , ආකෘති පත්‍ර 03 කින් 02 ක වාර්තා කිරීම පමණක් සිදු කර ඇති නමුත් ලංසුකරුවන් ඉදිරිපත් කළ මිලගණන් සහිත වාර්තාවක් එම අවස්ථාවේදී පිළියෙල කිරීම ප්‍රායෝගිකව අපහසු බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) 8.9.1(ආ) මාර්ගෝපදේශය | රු.500,000 ඉක්මවන භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 5 කදී රු.මිලියන 24.19 කට මිලදී ගෙන තිබුණු ශල්‍ය උපකරණ සම්බන්ධයෙන් එවැනි කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කර නොතිබුණි. | මෙම අතපසුවීම රට තුළ පැවති කොවිඩ් 19 වසංගතය මත සිදු වී ඇති බව හා මෙවැනි සිදුවීම් අවම කර ගැනීමට කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2007 ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය<br>(i) 2.1 මාර්ගෝපදේශය | ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි සහතිකය (NMRA Certificate) ලැබී ඇති වෛද්‍ය උපාංග පමණක් මිලදී ගත යුතු වුවද, එම සහතිකය ලබා ගෙන නොතිබුණු ශල්‍ය උපකරණ වර්ග 4ක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 4.78 ක් වැය කර තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත NMRA සහතිකය ලබාගැනීමට යටත්ව මිලදී ගැනීම අනුමත කර තිබුණු නමුත් එම සහතිකය ලබා නොදුන් බව හා හෘදසැත්කම්වල හදිසි අවශ්‍යතා සලකා මෙම අයිතම මිලදී ගැනීමට රෝහල් සභාපති අනුමැතිය ලබාදී ඇති බව. | ඖෂධ හා වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 5.2 මාර්ගෝපදේශය | හදිසි මිලදී ගැනීම් හැර තාක්ෂණික ඇගයීම් කමිටුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ නියෝජිතයෙක්, අදාළ විශේෂඥතාව සහිත අවම උපදේශකවරුන් දෙදෙනෙක් හා භාණ්ඩාගාරයෙන් නම් කරන ලද නියෝජිතයෙකුගෙන් සමන්විත විය යුතු වුවද, ඖෂධ හා ශල්‍ය උපකරණ මිලදී ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුව, රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙකු, අදාළ විශේෂඥතාව සහිත එක් උපදේශකයෙකු හා සහකාර ගණකාධිකාරිවරයෙකුගෙන් පමණක් සමන්විතව තිබුණි. | මෙම සංයුතියට අනුව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් පත්කර ගැනීම හා ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව ඉතාම අපහසු කාර්යක් බව. | -එම- |
| (උ) | 2015 මැයි 25 දිනැති අංක පීඑෆ් 02/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | (i) සන්නිවේදන පහසුකම් සැපයීමේ උපරිම මාසික සීමාවන්ට යටත්ව, හිමිකම් ලබන නිලධාරීන්ගේ සියළුම කාර්යාලීය හා නිවාස දුරකථන හා ෆැක්ස්, පෞද්ගලික ජංගම දුරකථන හා අන්තර්ජාල පහසුකම් ඇතුළු බිල්පත් වටිනාකම ප්‍රතිපූර්ණය කළ යුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි උපරිම මාසික සීමාවේ අගය දීමනාවක් ලෙස වැටුපට එකතු කර ගෙවා තිබුණි. ඒ අනුව 2020 වර්ෂය වෙනුවෙන් නිලධාරීන් 14 දෙනෙකු වෙත ගෙවා තිබුණු සන්නිවේදන පහසුකම් සැපයීමේ දීමනාවල එකතුව රු. 707,000 ක් විය. | 2022 ජනවාරි සිට 2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව ගෙවීමට කටයුතු කර ඇති බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | | (ii) චක්‍රලේඛය මඟින් ප්‍රතිපාදන සලසා නොතිබුණු මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී මාසිකව රු. 2,000 බැගින් රු.72,000 ක් සන්නිවේදන දීමනා ලෙස ගෙවා තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | 2016 ඔක්තෝබර් 10 දිනැති අංක.ඩීඑම්එස්/1758 -Vol.1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය. | අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන යෝජනා සකස්කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත යොමුකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඒ අනුව කටයුතුකර නොතිබුණි. | මේ වන විට කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය යෝජනා සැකසීම අවසන් අදියරේ පවතින බව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන බව. | අනුමත කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ යෝජනා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර අනුමත කරවාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 173.8 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.මිලියන 108.27 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 282.07ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වියදම වැඩිවීම රු.මිලියන 60.07 ක් වුවද, ආදායම රු.මිලියන 342.14 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහාරෝග්‍යශාලා මණ්ඩලය පිහිටි එම මණ්ඩලය සතු ඉඩමට අදාළ ඔප්පුව ප්‍රකාරව, සර්වෙයර් ජනරාල් (Surveyor General) විසින් 1981 දී හා 1983 දී සහතික කර තිබුණු පිඹුරුපත් 03 ක් යටතේ පවතින ඉඩම් කොටස්හි හෙක්ටයාර් 10.0229 ක මුළු භූමි ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය විය. ඉන් එක් පිඹුරුපතක ඇතුළත් හෙක්ටයාර් 9.9469 ක භූමි ප්‍රමාණය සර්වෙයර් ජනරාල් වෙතින් 2015 වර්ෂයේදී නැවත මිනුම් කරවා ගෙන තිබුණි. එදින වන විට මණ්ඩලයේ පරිහරණය සඳහා පැවති භූමි ප්‍රමාණය හෙක්ටයාර් 9.8047ක් පමණක් බවත්, ස්ථාන 09 කට අදාළව හෙක්ටයාර් 0.1422 ක භූමි ප්‍රමාණයක් අනවසර පදිංචිකරුවන් විසින් පරිහරණය කරන බවත් සර්වෙයර් ජනරාල් විසින් හඳුනාගෙන වාර්තා කර තිබුණද, ඒ සම්බන්ධයෙන් සුදුසු නෛතික ක්‍රියාමාර්ග ගැනීමට 2015 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ලබාගත් නීතිපති උපදෙස් ප්‍රකාරව, පිඹුර පිළියෙල කිරීමේදී කොටසක් මගහැරී ඇත්නම් ඒ මන්ද යන්න පිළිබඳව කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරයාගෙන් විමසා අවශ්‍ය නම් ඒ වරද නිවැරදි කිරීම සඳහා නැවත මිනුම් කිරීමටත්, අනවසරයෙන් අල්ලාගෙන ඇති ඉඩම් කොටස් ලෙස හඳුනාගෙන ඇති හෙ.0.1422 සඳහා 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරන බව. | නීතිපති උපදෙස් ප්‍රකාරව කටයුතු කරමින් මහාරෝග්‍යශාලා මණ්ඩලය පිහිටි එම මණ්ඩලය සතු ඉඩම නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්මික පුහුණු වැඩසටහන් ස්ථාපිත කිරීමේ අරමුණින් එවකට තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනාවක් අනුව මහාරෝග්‍යශාලා මණ්ඩලය, තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සමඟ 2013 මැයි 09 දින එළඹි අවබෝධතා ගිවිසුමක් මත සෞඛ්‍ය වෛද්‍ය අධ්‍යයන විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ආරම්භ කර තිබුණි. 2016 මැයි වන විට ගිවිසුම අවසන්ව තිබුණද එතෙක් පාඨමාලා අවසන් නොකළ ශිෂ්‍යයන් වෙනුවෙන් විද්‍යායතනය පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු අතර සෞඛ්‍ය අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි විද්‍යායතනය වෙත රු.මිලියන 3.8 ක් දක්වා මූල්‍ය පහසුකම් සැපයීමටත්, එම මුදල එවකට සෞඛ්‍ය පෝෂණ | රෝහලේ පාලනාධිකාරිය විසින් හිඟ මුදල් අයකරගැනීම සඳහා අමාත්‍යාංශ වෙත ලිපි ගණුදෙණු සිදුකරමින් උපරිමයෙන් කටයුතු කරන බව. | විද්‍යායතනය වෙනුවෙන් දරන ලද වියදම ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණයකර ගැනීමටත් අපේක්ෂාකර තිබුණද, 2016 වර්ෂයේ සිට 2019 වර්ෂයේ අවසානය දක්වා රෝහල විසින් වැයකර තිබුණු රු.මිලියන 8.94 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ඇ) | විශේෂඥ වෛද්‍යවරුන් සිය රාජකාරී වේලාවෙන් පසු සිදුකරනු ලබන ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් මාසිකව රු.581,418 ක් පමණ පොදුකාර්ය පිරිවැය ලෙස වැය කරන බව හඳුනාගෙන තිබුණි. නමුත් එම ශල්‍යකර්ම හා පරීක්ෂණ සඳහා අය කරනු ලබන වෘත්තීය ගාස්තුවලින් සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් අයකිරීමේ ක්‍රමවේදය මත සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු මුළු වෘත්තීය ගාස්තු රු.මිලියන 363.17 කින් අයකර තිබුණු මුළු සේවා ගාස්තුව රු. 546,035 ක් පමණක් විය. සේවා ගාස්තුව වැඩි කිරීම සම්බන්ධයෙන් 2019 සැප්තැම්බර් 25 දින අධ්‍යක්ෂ මණ්ඩලයට යෝජනා ඉදිරිපත්කර තිබුණද සත්‍ය වශයෙන් වැයකරන පිරිවැයට සාපේක්ෂව අය කරන සේවා ගාස්තුව වැඩිකර ගැනීමට මෙතෙක් අපොහොසත්වී තිබුණි. | සාමාන්‍ය වාට්ටුවල රෝගීන්ගෙන් අයකරන ලාභ ප්‍රතිශතය සියයට 10 ක් වන නමුත් ගෙවන වාට්ටුවල රෝගීන්ගෙන් අයකරන ලාභ ප්‍රතිශතය සියයට 30 ක් වන බැවින් රෝහල් ගාස්තු, ඖෂධ හා පාරිභෝජන ද්‍රව්‍ය ශල්‍යකර්ම ගාස්තු, පරීක්ෂණ ගාස්තු යනාදිය වෙනුවෙන් රෝහලට ඉහල ආදායමක් ලැබෙන බව, වෘත්තීය ගාස්තුවලින් සියයට 0.15 ක ගාස්තුවක් අයකරනු ලබන්නේ ඊට අමතර වශයෙන් බව හා මෙම ගාස්තුව, වෘත්තීය ගාස්තු සම්බන්ධ පරිපාලන ගාස්තුවක් පමණක් බව. | වෘත්තීය ගාස්තුවලින් රෝහල් සේවා ගාස්තු ලෙස අයකරන ප්‍රතිශතය නැවත සමාලෝචනය කළ යුතු අතර ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මහාරෝග්‍යශාලා මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ වෛද්‍ය නිලධාරිනියකට 2018 මැයි 30 දින සිට 2019 ජූලි 11 දක්වා වූ කාලය තුළදී වැටුප් රහිත විදේශගත පුහුණුවක් සඳහා එක්සත් රාජධානියේ Oxford විශ්ව විද්‍යාලයට යාමට ශිෂ්‍යත්වයක් ලැබී තිබුණි. වෛද්‍ය නිලධාරිනියගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු වෙනුවෙන් ගෙවනු ලබන දීමනාව මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් ගෙවීමට අදාළ නීත්‍යානුකූල භාවය පිළිබඳ කරුණු විමසීමෙන් තොරව හා නිලධාරිනිය විසින් ඉදිරිපත් කරන ලද විදේශ ශිෂ්‍යත්ව අයදුම්පත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේපකර තිබියදී එම නිලධාරිනියට ශිෂ්‍යත්වය සඳහා විදේශගත වීමට වර්ෂ 2 ක් දක්වා වැටුප් සහිත නිවාඩු හා පෞද්ගලික වියදම් දීමනාවක් (Personal Maintenance Allowances) ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. මේ හේතුවෙන් පෞද්ගලික වියදම් දීමනාව ලෙස ගෙවා තිබුණු රු.මිලියන 5.80ක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගත නොහැකිවී තිබුණු අතර එම මුදල හා වේතන ලෙස ගෙවූ රු.මිලියන 3,79 ක් රෝහලට වැය බරක්වී තිබුණි. | මෙම නිලධාරිනිය ශිෂ්‍යත්වය නිමවා දිවයිනට පැමිණීමෙන් පසු 2021 ජුනි 17 දින සේවයෙන් ඉල්ලා අස්වීම දක්වා කාලපරිච්ඡේදය මෙම රෝහලට සේවයකර ඇති බව, එමෙන්ම ඇය ශ්‍රී ජයවර්ධනපුර රෝහලෙහි සේවයෙන් ඉවත්ව ගියද මෙම ශිෂ්‍යත්වය වෙනුවෙන් අත්සන් කර තිබුණු ඇප බැඳුම්කරය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මාරු කර යවා ඇති බව හා ඒ අනුව එහි සඳහන් කොන්දේසි තවදුරටත් බලපැවැත්වෙන බව. | විදේශ ශිෂ්‍යත්ව අයදුම්පත සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රතික්ෂේපකර තිබියදී එම නිලධාරිනියට ශිෂ්‍යත්වය සඳහා විදේශගත වීමට වර්ෂ 2 ක් දක්වා වැටුප් සහිත නිවාඩු හා පෞද්ගලික වියදම් දීමනාවක් ගෙවීමට තීරණය කර තිබුණු වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා අපේක්ෂිත විදේශ අරමුදල් ලබාගැනීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමකින් තොරව සයමහල් ගෙවන වාට්ටු සංකීර්ණයක් ඉදිකිරීමේ මූලික සැලසුම් කටයුතු සඳහා 2017 අප්‍රේල් 08 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත එකතු කළ අගය මත බදු සහිතව උපදේශන සේවා ගාස්තු ලෙස රු.මිලියන 5.76 ක් ගෙවා තිබුණි. නමුත් 2020 හා 2021 වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැසුම් වලින් මෙම ව්‍යාපෘතිය ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මකවීම අවිනිශ්චිත බැවින් වැය කළ රු.මිලියන 5.76 ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්විය හැකි බව නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රතිපාදන තත්ත්වය සතුටුදායක වූ විටෙක මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේ බලාපොරොත්තුවක් ඇති බැවින් අදාළ මූලික කටයුතු වෙනුවෙන් ගෙවා ඇති මුදල නිෂ්කාර්ය වියදමක් නොවන බව. | මෙය නිශ්කාර්ය වියදමක් බවට පත් වුවහොත්, ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා අපේක්ෂිත විදේශ අරමුදල් ලබාගැනීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව උපදේශන සේවා ගාස්තු ලෙස රු.මිලියන 5.76 ක් ගෙවීමේ වගකීම දරන නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගත යුතුය. |
| (ආ) | මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සූර්ය බලශක්ති පද්ධති (Solar Energy Panels) ව්‍යාපෘතිය සඳහා උපදේශක ගාස්තු වශයෙන් රු.මිලියන 2.97ක් 2018 වර්ෂයේදී මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට ගෙවා තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් ගෙවිය යුතු මුදල රු.372,803ක් විය. නමුත් 2020 හා 2021 වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැසුම් වලින් මෙම ව්‍යාපෘතිය ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මකවීම අවිනිශ්චිත බැවින් වැය කළ රු.මිලියන 2.97ක වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්විය හැකි බව නිරීක්ෂණය විය. | රජයේ මූල්‍ය තත්වය අනුව යමින් සූර්ය බලශක්ති ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීමට රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ බව, ඒ අනුව 2020 හා 2021 ක්‍රියාකාරී සැලැස්මෙන් මෙම ව්‍යාපෘතිය ඉවත් කළ බව හා මූල්‍ය ප්‍රතිපාදන තත්ත්වය සතුටුදායක වූ විටෙක මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භකිරීමේ බලාපොරොත්තුවක් ඇති බැවින් අදාළ මූලික කටයුතු වෙනුවෙන් ගෙවා ඇති එම මුදල නිෂ්කාර්ය වියදමක් නොවන බව. | මෙම වියදම නිශ්කාර්ය වියදමක් බවට පත් වුවහොත්, නිසි සැලැසුමකින් තොරව උපදේශක ගාස්තු වශයෙන් රු.මිලියන 2.97ක් ගෙවීමේ වගකීම දරන නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගත යුතුය. |
| (ඇ) | මහාරෝග්‍යශාලා මණ්ඩලයේ පවතින තොග සම්බන්ධ පරිගණක පද්ධතියේ තොරතුරු ගිණුම්කරණ පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමෙන් පසු සිදුවන වෙනස්කම් නැවත ගිණුම්කරණ පද්ධතිය තුළ යාවත්කාලීන නොකළ අවස්ථා නියැදි පරීක්ෂණයකදී අනාවරණය විය. මේ හේතුවෙන් ගිණුම්කරණ | නිවැරදි කළ යුතු ආකාරය ඇතුළු පරිගණක කටයුතුවලට උපදෙස් ලබාදීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පරිගණක විශේෂඥ උපදේශකවරයෙකු පත්කිරීමට අනුමැතිය ලබාදී ඇති බව හා ඔහුගේ නිරීක්ෂණ වාර්තාවෙන් පසු ඉහත පද්ධති දෙක අතර ඇති වැරදි අවම කිරීමට පියවර ගන්නා බව. | නිරීක්ෂණය කර ඇති පරිගණක ගිණුම්කරණ පද්ධතියේ පවත්නා අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

පරිගණක පද්ධතිය තුළ පවතින ගැනුම් පිරිවැය, ණයහිමියෝ, ණයගැතියෝ සහ රෝහල් ගාස්තු ආදායම යන අයිතමයන්ගේ සත්‍ය අගයන් මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය වන්නේද යන්න පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. රෝහලේ පවතින පරිගණක පද්ධති යාවත්කාලීන නොකිරීම, පරිගණක පද්ධති අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් (System link) ඇතිකර නොතිබීම සහ පරිගණක පද්ධතියේ දත්ත ඇතුළත් කිරීම, පරීක්ෂා කිරීම හා අනුමත කිරීමට අදාළ ක්‍රියාපටිපාටි නිසි අධිකාරී බලයක් යටතේ ක්‍රියාත්මක නොවීම මීට හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය. එසේම මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමෙන් පසුව පද්ධතියේ ඇතුළත් වාර්තා වෙනස් කිරීමට ඇති පහසුකම අහුරා තැබිය යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දත්ත ස්කෑන් කිරීමට, සමාජ මාධ්‍යගතකරණයට හා කාර්යමණ්ඩල දීමනා ආදිය සඳහා විද්‍යුත් ලිපිලේඛන කළමනාකරණ පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පරිගණක මෘදුකාංගයක් මිලදී ගැනීමට අදාළව 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළදී රු.මිලියන 21.56 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් මෙම පරිගණක පද්ධතිය භාවිතකර නොතිබුණු හෙයින් මේ සඳහා දරන ලද පිරිවැය නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | 2021 දෙසැම්බර් 01 දින සිට රෝහල් පරිගණක වැඩසටහන යාවත්කාලින කිරීම ආරම්භ කර ඇති බව හා ස්කෑන් කරන ලද රෝගීන්ගේ ඇඳඉහපත්හි තොරතුරුද ඒ සඳහා භාවිතයට ගතහැකි අයුරින් පවතින බැවින් ඇඳඉහපත් ස්කෑන් කිරීම සඳහා වැයකරන ලද රු.මිලියන 21.56 නිශ්කාර්ය වියදමක් නොවන බව. | මෙම පරිගණක පද්ධතිය ස්ථාපිත කරන ලද අරමුණ වෙනුවෙන් යොදා ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ටෙන්ඩර් කොන්දේසිවලට අනුව නැවත මිල වැඩි කිරීම් සඳහා අනුමැතිය ලබාදිය නොහැකි වුවද ඒ බව නොසලකා , SUCOD 160 Disposable Examination 570,000 ඒකක Gloves (Small) Lalan SUCOD ක් හා159Disposable | ටෙන්ඩර් කොන්දේසිවල මිල වැඩිවීමක් අනුමත නොකරන බව දක්වා තිබුණු නමුත්, COVID -19 වසංගතය හේතුවෙන් Disposable Examination Gloves සඳහා වූ අවශ්‍යතාවය කිහිප ගුණයකින් ඉහළ ගිය බැවින් රෝගී සේවාව පවත්වාගෙන යාම සඳහා ලංකාව තුළ සිටි එකම සැපයුම්කරුගේ ඉල්ලීම සලකා බැලීමට සිදුවූ බව හා මෙම | ටෙන්ඩර් කොන්දේසිවලට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ගෙන් වැඩිපුර ගෙවූ මුදල අයකළ යුතුය. |

| | | |
|---|---|---|
| ) Examination GlovesMedium Lalan ( ඒකක 730,000 ක් එකක් රු 6 .ක් වැඩියෙන් එනම් රු 11.කට මිලටගැනීම නිසා රු 3.78 මිලියන.ක් වැඩිපුර ගෙවා තිබුණි. | මිල වැඩි කිරීම ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර ඇති බව. | |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා තනතුරු 03ක් සඳහා නිලධාරීන් 251 දෙනෙකු බඳවා ගෙන තිබුණි. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු 05ක් සඳහා නිලධාරීන් 10 දෙනෙකු පත්කර තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම බඳවා ගැනීම් සිදුකළ බව හා ඉදිරියේදී යෝජිත බඳවා ගැනීමේ පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේදී මෙම සියලු තනතුරු නාම ආවරණය වන බව. | මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |